# බෞද්ධ දර්ශණයෙන් ඔපවත් වූ අපේ ගීතය



**මහින්ද දිසානායක - දිවුල්ගනේ**

පෙදෙන් බුදු සිරිත යනුවෙන් පැරණී කාව්‍යාචාරවරු පා¡යෙන් බුද්ධ චරිතය වර්ණනා කළෝ ය. බුදු සිරිතෙහි දැක්වෙන සිද්ධි මාලාවන් හා පන්සිය නස් ජාතක පොතෙහි යම් යම් කථා වස්තු තම කාව්‍ය රචනා සඳහා පාදක කරගත් බව පැරණී පොත පතින් එළි දැක්වේ. කවිය පමණක් නොව මුල් වකවානුවේ ගීතයද බුදු ගුණ වැනීමම පරමාර්ථ කොටගත් බව කවිය හා සමකාලීනව විමසීමේ දී පැහැදිළි වේ. පැරණී කවිය බුදු ගුණ වැනීමට උපකාර වූවා සේ ම ගීතයද ඒ මාර්ගයම අනුගමනය කළ බවක් පෙනෙයි. එපමණක් නොව එම යුගයේ සියළුම සාහිත්‍යාංග වලද එකම අභිලාශය වූයේ බුදු සිරිත ඉතා උසස් ලෙස ඉහළම තලයක සිට වර්ණනා කිරීමයි.

මුල් අවධියේදී ගීතය බෞද්ධ දර්ශණයේ ගුඹුරු තැන් සොයා නොගොස් මතුපිටෙන් බුද්ධ චරිතයේ යම් සුවිශේෂ අවස්ථා ද වරෙක පන්සිය පනස් ජාතක පොතේ ජනතාව අතර ප්‍රසිද්ධියට පත් වූ ජාතක කතා ද ඒ සඳහා යොදා ගත් බව පෙනෙයි. ධශබලධාරී පැරණී ගීතය චන්ද කින්නර කතා වස්තුව ඇසුරින් ජනතාව වෙත උපදේශයක් දීමේ පරමාර්ථයෙන් රචිත ගීතයකි. විශේෂයෙන් බෝධිසත්වයන් වහන්සේගේ බල මහිමය හුවා දක්වා හුදී ජනතාවගේ පහන් සංවේගය ඉස්මතු කිරීම මූලික වූ අභිලාශය විය.

තිලෝවග රාජා භව සැරි සරලා යන ගීතය තුළින් අසිරිමත් බුදු සිරිත වර්ණනාවට ලක්කරීම ගීත රචකයාගේ මූලික පරමාර්ථය වූ බව පෙනේ. එපමණක් නොව එනල බුදු රජුන් ගේ පාදස්පර්ශයේ පහස ලත් ශ්‍රී පාද කන්ද පිළිබඳව ගීත කීපයක්ම විය. ශ්‍රී පාදේ සමණළ කන්ද පෙනේ, නන්දන දිරිපාදෙ වඳිමු, ආදී ගීත මේ සඳහා උදාහරණ ලෙස පෙන්වා දිය හැකි ය. දුර ජේන තැනිතලා අනුරාධපුර දිහා යන ගීතය ද බෞද්ධ සිද්ධස්ථාන මුල් කරගෙන එමගින් බෞද්ධ ජනතාවගේ ශ්‍රද්ධාව වැඩි දියුණු කිරීමේ උසස් බලාපොරොත්තුවෙන් රචිත ගීත වෙයි..

විශේෂයෙන් දන්නෝ බුදුන්ගේ ශ්‍රී ධර්මස්කන්ධා වැනි ගීත හුදු බොදුනුවන්ගේ හෘද ස්පන්දනය සමග ජනප්‍රිය වූවා පමණක් නොව එම ගීතය තරමක් ඔබ්බට යමින් බුදුරජුන්ගේ චචිත කතාවෙන් මිදී බෙදු ධර්මය මිළිබඳව දැනුවත් කිරීමටම රචනා විය.

මිහිඳු හිමියන් ලක්දිවට බුදු දහම හඳුන්වා දී ජනතාවගේ හදවත් තුළ බෞද්ධ චින්තනය නිදන් කර එය ජීවිත වලට සමීප කරවන්නට හේතු විය. බුදු දහමේ සාරධර්ම එදිනෙදා තම ජීවිත වලට සම්බන්ධකර ඒ අනුව ජීවිතය සකස්කර ගන්තා පමණක් නොව තම සිතුම් පැතුම් ද බෞද්ධ හැදියාවේ හා බෞද්ධ දර්ශනයේ උසස් පරමාර්ථ ජීවිතය හා බැඳී සැදී තිබුණි. මේ නිසාම පැරණි ප්‍රතිමාවක , චිත්‍රයක, කවියක, ගීතයක බොදු ඉගැන්වීම නිරායාසයෙන්ම ඔප්නැංවී තිබීම නොවැළැක්විය හැක්කක්ම විය. බොදු බැතියෙන් පිරී ඉතිරී ගිය හදවතින්ම මිංහල ගීතයද නිර්මාණය විය. අංගුලිමාල චිත්‍රපටයට ලියූ ඔබෙ රාගී මන කැළඹේ දෝ යන ගීතය බොදු ජනතාවගේ හදවවේ උපන් ඔවුන්ගේ ලේ ඇට මිදුළු වලට පවා කිඳා බැස බොදු බැතියෙන් පහන් කළ නිර්මාණයක් විය. බොදු බැතියෙන් හද සසල කරවන්ක්ම වූ බව පෙනේ.

පැරණී ගීතයෙන් මිදී වර්තමාන ගීත සාහිත්‍යය දෙස දිමර්ශණාත්මකව බලන විට වර්තමාන ගීතය නව මාවතකට පිවිස ඇති බවක්ද පෙනේ. විශේෂයෙන් බෞද්ධ චින්තනය ගැබ් වූ පැරණී ගීතය බුදුරජුන්ගේ චරිත කතාව ආශ්‍රයෙන් හෝ පන්සිය පනස් ජාතකය මුල්කොටගෙන හෙට් බෞබ්ධ සිද්ධස්ථාන පිළිබඳ ඇති වූ ශ්‍රද්ධාව මුල් කොට ගෙන රචනා වූ ගීත ම විය. එහෙත් එයින් ඔබ්බට යමින් බෞබ්ධ දර්ශනයේ ගැඹුරු තැන් තම ගීතය සඳහා යොදා ගනිමින් ජීවිතයට හරවර් දර්ශනයක් ඉදිරිපත් කරන්නට වර්තමාන ගීත රචකයා සමත් වූ බවක් පෙනේ. අනිත්‍යය, චතුරාර්ය සත්‍ය ධර්මය, හේතු ඵලවාදය වැනි ගැඹුරු ධර්මතා ඔවුන්ගේ ගීත තුළ කතාවට භාජනය වී තිබුණි. විශේෂයෙන් සිතේ පැවැවිම මිතුවිලි පිළිබඳව අභිධර්මය ආශ්‍රය කරගත් ගීතය හදවත් වලට සමීප කරගන්නට මහඟු අත්වැලව් ම විය. භවය, මිනිසත් බව, බිවන වැනි බෞද්ධ ධර්මය ආශ්‍රය කරගත් ධර්මතා ගැන ගීත ඉදිරිපත් කිරීම නිරායාසයෙන් සිදුවූවක්ම විය.

***මිහිඳු හිමියන් ලක්දිවට බුදු දහම හඳුන්වා දී ජනතාවගේ හදවත් තුළ බෞද්ධ චින්තනය නිදන් කර එය ජීවිත වලට සමීප කරවන්නට හේතු විය. බුදු දහමේ සාරධර්ම එදිනෙදා තම ජීවිත වලට සම්බන්ධකර ඒ අනුව ජීවිතය සකස්කර ගන්තා පමණක් නොව තම සිතුම් පැතුම් ද බෞද්ධ හැදියාවේ හා බෞද්ධ දර්ශනයේ උසස් පරමාර්ථ ද ඔවුනගේ ජීවිතය හා බැඳී සැදී තිබුණි.***

සසර වසන තුරු නිවන් දකින තුරු පින් කෙත හෙළ රන් දෙරණෝ යනුවෙන් පන්ඩිත් අමරදේවයන් ගයන්නේ එහි සසර ගමනේ පැවැත්මත් නිවන් දකිනතුරු සත්වයා සසර උපදිමින් මැරෙමින් ගමන් කරන බවර් ඒ සඳහා පින් අවශ්‍ය බවත් පින් කිරීමේ කුඹුරක් ලෙස ලංකාදීපය හැඳින් වූ බවත් පැහැදිළිවේ. මහවැස්සට පෙර කබාය ඉරිලා ශ්‍රීට කමක් නැහැ යනුවෙන් මිනිසා තරුණ කාලයේ සිය මහළු වීම ජීවිතයේ ස්වභාවයත් එහි අනිත්‍යයත් අපට පසක් කර දෙන්නට හොඳම අවස්ථාවකි. තන්යා ආශා ඔබගු කරේ ලා, කරදර පොදි බැඳ ගැල පිට පටවා යනුවෙව් තණ්හාව ආහාව මිනිසුන් ජීවත් කරවන්නා සේම සසර ගමන් කරන්නා විසින් මල්ලක ලා මෙය රැගෙන යයි. සන්නාලියනේ ගීතය මිනිසාගේ ඉපදීම මරණය රිළිබඳව ඉතා උසස්ම ඇගැයීමක් බෞද්ධ චින්තනය තුළින් ලබා දී ඇත. වරෙක අමරදේවයන් ගායනා කළ සංසාර ගමනේ තණ්හා ආශා ගීයෙන් කෙළෙස් ධර්මයන් පිළිබඳවත් සසර ගමන තණ්හා ආශාව මිනිසා ගේ ජීවවි වීමේ පැවැත්මත් කියවෙයි.

වික්ටර් රත්නායක ගායනා කරන මොහෙන් මුළා වෙලා ගීයෙන් මෙම්හය හෙවත් මෝඩකම මිනිසා ගේ සසර ගමනට බාධා කරනා ධර්මතා ලෙසත් ජීවිතයේ හරය තේරුම් ගැනීමට පමණක් නොව චතුරාර්ය සත්‍යය අවබෝධයටද එය බාධාවව් ම වේ. කරුණාරත්න දිවුල්ගනේ ගායනා කරන අතීතය සිහිනයක් පමණම් යන ගීතය රචනා කර ඇත්තේ භික්ෂූන් වහන්නේ නමක් නිසාදෝ එහි කියවෙන්නේ හේතු ඵල වාදයදි. එදා ඔහු පෙම් නොකළා නම් අද වියෝගයක් වෙන්වීමම් නොවන බවව් පවසයි. සදාකාලික නොවූ ලෝකය යනුවෙන් සුනිල් එදිරිසිංහ ලෝකයේ පැවැව්ම පිළිබඳව අනිත්‍ය ධර්මය කුලුගන්වන්නට සමම් වෙයි. නන්දා මාලිනිය ගායනා කරන රිවන් දක්නා යනුවෙන් සසර ගමනේ අවසානය නිවන බව අපට පසක් කරයි. තවව් විටෙක ප්‍රේමය රාගයෙන් හා ආශාවෙන් තොර බවත් එය හුදු නිවන් අරමුණු කල එහි ගමන් ගන්නා මාම්ගයේ මූලික හරය බවව් පෙන්වා දෙදි.

එහෙත් මුල් අවධියේ සේ බුදු රජුන්ගේ බුදු සිරිතේ අවස්ථාවන් හෝ වෙනත් සිද්ධීන් මුල්කොට ගත් ගීත ද නැත්තේ නොවේ. එහෙත් අතීත ගීතයේ මෙන් නොව ඒ සඳහා ඔවුන් අලුත් දර්ශනයක් ඉන් පෙන්වා වීමට මිතරම උත්සුක වීම වැදගම් ලක්ෂණයක් සේ පෙනේ. බුදු කරුණා දෑස තෙමී, ඇසේ මතුවන, සමිඳු පාමුළ, නිදුකාණනේ, ලා දළු බෙබිපත් ආදී ගීත මේ සඳහා හොඳම උදාහරණ සේ පෙන්වා දිය හැකි ය. එපමණක් නොව සෑම ගීතයකම පාහේ බෞද්ධ දර්ශනයේ සෙවණැල්ල වැටී එයට මහත් ආලෝකයක් සලසා දීම වැදගත් වූ ලක්ෂණයක් වී ඇති බව පෙනෙයි. ■

